www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කැත්‍රිනා කුනාටුවෙන් දෙවසරකට පසු

## *පලමු කොටස: නිව් ඕර්ලියන්ස් - සමාජ සහ ආර්ථික ආපදාවට මුහුනපා ඇති නගරයක්*

**Hurricane Katrina two years on**
**Part 1: New Orleans—A city in social and economic distress**

**කේට් රැන්ඩෝල් විසිනි**
**2007 අගෝස්තු 29**

*පහත පලවනුයේ කැත්‍රිනා ඛේදවාචකයේ දෙවර්ෂ අනුස්මරනය පිලිබඳ ලිපි මාලාවක පලමු වැන්න ය. ඉදිරි ලිපි නිවාසවල තත්වය, ගංවතුර බාධක වැටි පද්ධතියේ තත්වය, මුහුදු බොක්ක කලාපයේ ලාභ ගැරීම සහ අනෙකුත් කාරනා සාකච්ඡා කරනු ඇත.*

දෙවසරකට පෙර, 2005 අගෝස්තු 29 වන දා කැත්‍රිනා කුනාටුව ඇමරිකානු ගල්ෆ් වෙරල තීරයට කඩා වැදුනේ ය. සති ගනනාවක් මුලුල්ලේ නගරය සහ ප්‍රත්‍යන්ත ජනාවාසවල හතරෙන් තුනකටත් වඩා ජලයට යට කරමින් කුනාටුව නැගෙනහිර දෙසට ඇදී යද්දී නිව් ඕර්ලියන්ස් අගනුවර සියලුම ගංවතුර බාධක වැටි බිඳී ගියේ ය. පාලම්, බෝට්ටු නිවාස සහ මෝටර් රථ රට තුලට ගසාගෙන ගිය අතර මිසිසිපි ගල්ෆ් වෙරල තීරයට බරපතල අලාභයක් සිදුවිය.ව්‍යසනය වර්ග සැතපුම් 95,000ක් ඉක්මවා පැතිර ගිය බවට ගනන් බලා ඇත.

කුනාටුවෙන් සිදු වූ මරන පිලිබඳ නිල සංඛ්‍යාවන් 1,836ක් වූයේ නමුත් තවත් බොහෝ ජීවිත සංඛ්‍යාවකට සිදු වූ දේ පිලිබඳව කිසිවක් එලි වී නැත. සිදු වූ අලාභහානිය ඩොලර් බිලියන් සිය ගනනකි. මිලියනයකට වැඩි පිරිසක් අවතැන්වූ අතර බොහෝ දෙනකු අද දක්වා ම ආපසු නිවෙස්වලට පැමින නැත. කෙසේ වෙතත්, මෙසේ ගෙඩි පිටින් එන සංඛ්‍යා ලේඛන පවා කැත්‍රිනා ඛේදවාචකයෙන් නිර්මිත වූ මානුෂීය වධ වේදනාවේ පූර්න බලපෑම ප්‍රකාශයට පත් නො කරයි.

කැත්‍රිනාව තරම් බල සම්පන්න කුනාටුවක් සඳහා වූ නුසූදානම - නිව් ඕර්ලියන්ස් තුලට වදිද්දී එය ප්‍රමානාංක 3ක කුනාටුවක් වීය - සහ ආන්ඩු බලධරයන්ගේ අක්‍රීය සහ සාපරාධීව නොසැලකිලිමත් වූ ප්‍රතිචාරය නූතන ඇමරිකානු ඉතිහාසයේ විශාලතම අසාර්ථකත්වයන්ගෙන් එකක් ලෙසට ගනන් තැබේ. බිලි වූවන් ගංවතුරේ ගිලී යාමට අතහැර දමුන අතර බේරාගන්නවුන් ප්‍රමානවත් ආහාර, ජලය හෝ වෛද්‍ය ප්‍රතිකාර නැති අපිරිසිදු ආපදා මධ්‍යස්ථානවලට ගාල් කරනු ලැබුනි. ඔවුහු පොලිස් ප්‍රචන්ඩත්වයට ගොදුරු කරනු ලැබූහ. බේරාගැනීමේ උත්සාහයන් අවුල්වී ගොස් ප්‍රමාද වීය.

කැත්‍රිනා කුනාටුව ඇමරිකානු ධනවාදී පදනමේ කුනු වීම එලිදරව් කලේ ය. එය ඉසුරුමත් ධනවත්කම සමග හරිහරියට ඇති පරිපීඩිත දරිද්‍රතාවය එනම්, පන්ති භේදයෙන් ඉරීගිය සමාජය හෙලිදරව් කලේ ය. ගංවතුර බාධක වැටිවල සහ අනෙකුත් යටිතල ව්‍යූහයේ අසාර්ථකත්වය මෙන් ම යලි ගොඩ නැගීමේ ප්‍රයත්නවල සම්බන්ධී කරනයක් නොතිබීම, ඉසුරුමත් ප්‍රභූවක් විසින් පෞද්ගලික ධනය ගොඩගසා ගැනීම වෙනුවෙන් සිය පුරවැසියන්ගේ ජීවිත හා සුභසාධනය යට කර දමූ පද්ධතිය වෙතට ඇඟිල්ල දිගු කරයි. කුනාටුව ස්වාභාවික ප්‍රපංචයක් වන නමුදු (භූගෝලීය උනුසුම් වීම ඊට බලපෑවා විය හැකි නමුත්) ඉන් ඇති වූ විනාශයේ පරිමාව මිනිසාගේ නිර්මානයකි.

වසර දෙකක් ඉක්මවා යද්දීත් නිව් ඕර්ලියන්ස් ගරාවැටුනු හා සුන්බුන් වූ නගරයක්ව පවතී. ඇමරිකානු වෛද්‍ය සංගමයේ සඟරාවේ පලවූ එක් සංඛ්‍යා ලේඛනයක් දැනට සිදු වෙමින් තිබෙන සමාජ ව්‍යසනයේ පුලුල් පරිමාව මතු කර දක්වයි: 2006 මුල් අර්ධයේ දී නිව් ඕර්ලියන්ස්හි මරන අනුපාතය පූර්ව කැත්‍රිනා මට්ටම හා සසඳන කල සියයට 50කට ආසන්න ඉහල යාමක් පෙන්වයි.

දූන් සංචාරකයන්ට සහ ධනවතුන්ට සැප පහසුකම් සලසා දීමට යුහුසුලු වන ප්‍රදේශවලට වෙනස් ලෙස නිව් ඕර්ලියන්ස්හි දුප්පත්ම සහ පරිපීඩිත ප්‍රත්‍යන්ත ප්‍රදේශයන්හි තත්වයන් ඇමරිකාවේ දැවැන්ත සමාජ බෙදුම්කඩනය විචිත්‍රවත්ව පිලිබිඹු කරයි. ජෑස් නමින් හඳුන්වනු ලබන සංගීත සම්ප්‍රදාය ද සමග සංස්කෘතික ප්‍රතිපදානයන්ගේ අද්විතීය මධ්‍යස්ථානයක් වන මෙම ප්‍රධාන ඇමරිකානු නගරයේ විශාල කොටසක් ජරාවාස වීමට අත හැර දැමීම පාලක සංස්ථාපිතයට එල්ල වන දෝෂාරෝපනයකි.

ඉරාකයේ එක්සත් ජනපද වාඩි ලා ගැනීමත්, යුද්ධයත්, යන සාපරාධී ව්‍යාපාරය ගනන්බලා ඇති ආකාරයට ඩොලර් ට්‍රිලියනයකට වැඩි මිලක් දරාගෙන ඉදිරියට යයි. ඒ සමග ම එක්සත් ජනපදය තුල ආර්ථික හා සමාජ ධ්‍රැවාන්තගතවීම ඉහල නගියි. මහා ව්‍යාපාරයන්ගේ පක්ෂ දෙක ඇමරිකානු ජනතාවගේ ආරක්ෂාව සඳහා යයි පෙන්නුම් කරමින් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" හරඹ කරද්දී ආන්ඩු බලධාරීන් කැත්‍රිනා කුනාටුව ප්‍රකාරයේ විපත්තියකින් ජනතාව ආරක්ෂා කර ගැනීමට 2005 අගෝස්තුවේ දී සිටියාටත් වඩා නුසූදානම් ය.

ජනතාව, ගල්ෆ් මුහුදු තීරයට සිදු වූ විපත්තියේ දෙවන වසර සමරන්නේ, මේ මස මුල දී මිනෙසෝටා ප්‍රාන්තයේ කාර්ය බහුල මහා මාර්ග පාලම ජීවිත දුසිමකට වැඩි ගනනක් බිලි ගනිමින් කඩා වැටීමෙන් අනතුරුව ය. රටේ භෞතික යටිතල ව්‍යූහය පුරා පැතුරුනු පරිහානිය පිලිබඳ දර්ශකයක් වනුයේ රටේ පාලම්වලින් සියයට 27ක් "ව්‍යූහාත්මකව අබලන්"යැයි හඳුන්වා තිබීම ය.

ගල්ෆ් වෙරල තීරය යලි ගොඩනැගීම පිලිබඳ ෆෙඩරල් රාජයේ ජාතිකව සම්බන්ධීකරනය වූ වැඩපිලිවෙලක් නැත. ආන්ඩු බලධාරීන් විසින් පොරොන්දු වූ මූල්‍ය ආධාරවලින් අතිවිශාල කොටසක් විපතට පත් වූවන් අතට කිසි දිනෙක ලඟා නොවී ය. ඉන් කොටසක් නිලධාරී ආකාර්යක්ෂමතාවය නිසා සිරවී තිබෙන අතර වැඩි කොටසක් ව්‍යසනය හමුවේ පිහිටුවන ලද ගල්ෆ් ආපදා කලාපයේ ටෙන්ඩර් රහිත කොන්ත්‍රාත්තුවලින් ලාභ ගරාගත් පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගේ සාක්කුවලට ගලා ගියේ ය.

2005 සිට ගල්ෆ් මුහුදුබඩ තීරයේ ප්‍රතිසංස්කරනවලට වියදම් කලා යැයි බුෂ් පරිපාලනය විසින් කියනු ලබන ඩොලර් බිලියන 116න් දිගු කාලීන ව්‍යාපෘති සඳහා වෙන් කර තිබෙන්නේ සියයට 30ක් පමනි. 2007 අගෝස්තු වන විටත් ජනාවාස සංවර්ධන නිවාස ප්‍රතිපාදනවලට වෙන් කරන ලද ඩොලර් බිලියන 16.7න් වියදම් කර තිබෙන්නේ තුනෙන් පංගුවටත් අඩු ප්‍රමානයකි.

2007 කුනාටු සමය එලඹෙද්දී, ගංවතුර බාධක වැටි ප්‍රතිසංස්කරනයට ඇමරිකානු හමුදාවේ ඉංජිනේරු බලකායට වෙන්කරන ලද ඩොලර් බිලියන 8.4න් වියදම් කර තිබුනේ සියයට 20ක් පමනි. කැත්‍රිනා වැනි බලගතු කුනාටුවකින් නගරයේ පහල නමවන කොට්ඨාශයේ ආරක්ෂාවට ඇති තාප්ප ඉක්මවා ජලය දැමීමට තවමත් ඉඩ තිබෙන බවත්, තවමත්, ප්‍රමානාංක 5ක කුනාටුවකට මුහුන දීමට සවිමත් ආරක්ෂක වැටි ඉදිකිරීමේ සැලැස්මක් නොමැති බවත් බලධාරීහු පිලිගනිති.

නගරයේ ප්‍රන්සයට නැකම් කියන කොටස, එහි කැසිනෝ සූදු පිටිවල සහ හෝටල් සහිත ප්‍රදේශය යලි පනගැන්වීම ගැන තොරෙම්බල් කිරීමට මාධ්‍ය කඩිමුඩියේ පෙරට ආ නමුදු, යහපත් නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම් අඩමානව තිබීම හේතුවෙන් නිව් ඕර්ලියන්ස්හි කම්කරු හා පීඩිතයන් මහත් බහුතරය අනාරක්ෂිත සමාජ කොන්දේසි යටතේ ජීවත් වෙති.

නිව් ඕර්ලියානු මහා නගර සීමාව තුල නිල විරැකියා අනුපාතය දැන් වසරකට පෙර තිබූ සියයට 4.5 සිට සියයට 5.1ට පත්ව තිබේ. එය කැත්‍රිනා ව්‍යසනයට පෙර තිබූ සියයට 5.3 මට්ටමට වඩා සුලු වශයෙන් පහල අගයක් පෙන්වයි. මෙම සංඛ්‍යා ලේඛන නිව් ඕර්ලියන්ස්හි දැඩි ලෙස හානියට පත් ප්‍රදේශවල සැබෑ තත්වය පිලිබිඹු නොකිරීමත් ආපසු නොපැමිනි දහස් ගනනක් වූ අවතැන් වූ රැකියා විරහිතයන් සැලකිල්ලට ගැනීමට අසමත් වීමත් නිසා යථා තත්වය වසං කර තබයි.

දක්ෂින අධ්‍යයන ආයතනයේ වාර්තාවකට අනුව නිව් ඕර්ලියන්ස් හි 2005 කුනාටුවට පෙර තිබුනාට වඩා රැකියා අවස්ථාවන් 118,000ක් නැති වී ඇති අතර එකල විරැකියාව ජාතික අනුපාතය මෙන් දෙගුනයක් ඉක්මවා යන සියයට 12ක්ව තිබුනි. කැත්‍රිනාවට පෙර නගරයේ ජනගහනයෙන් තුනෙන් පංගුවක් දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත් වූ අතර ඉන් බහුතරයක් කලු ජාතිකයන් වී ය. අලුත් රැකියාවලින් බොහොමයක් අඩු වැටුප් සහිත සේවා සපයන ආපනශාලා හා හෝටල් රැකියා වන අතර නගරයේ දුගීන් දරිද්‍රතාවෙන් මුදා ගැනීමට එමගින් කිසිවක් සිදු නොවනු ඇත.

ප්‍රතිසංස්කරන කටයුතුවල යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන් වැටුප් ගසාකෑම පිලිබඳව ප්‍රචලිත වාර්තා තිබේ. රැකියා සොයමින් කුනාටුවට පසුව ප්‍රදේශයට පැමිනි වාර්ගික ලතින් ඇමරිකානු කම්කරු සංක්‍රමනිකයන් ගෙන් බොහෝමයක් පිලිබඳව මෙය විශේෂයෙන්ම සත්‍යයක් වන අතර ඔවුන්ගෙන් සමහරු සේවා දායකයන්ගේ වහල් සේවා කොන්දේසිවල හිර වී සිටිති. ඇමරිකානු කම්කරු දෙපාර්තමේන්තුව කම්කරුවන්ට නොගෙවූ වැටුප් ඩොලර් මිලියන 5.4ක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ආපසු අය කර ගෙන තිබේ.

නිව් ඕර්ලියන්ස් මුහුන දෙන යතාර්ථය වනාහී 2005 සැප්තැම්බර් 15 දා නගරයේ පාලු ප්‍රදේශයක පිහිටි ජැක්සන් චතුරස්‍රයේ සිට ජනාධිපති බුෂ් විසින් ප්‍රකාශයට පත් කල "ඇමරිකානුවන්ට අවශ්‍ය වන්නේ හුදෙක් ගල්ෆ් වෙරල තීරය යලි පනගැන්වීම නොව දියුනුවට පත්වීම ය. ඔහේ ඉදීම නොව ජය ගැනීම ය. හොඳ හේතු නිසා තමන් ආදරය කරන ස්ථානයේ වඩා යහපත් ජීවිතයකට ඇත්තට ම ප්‍රස්තාව ඇති හෙයින් ඉවත්ව ගිය අය යලි ආපසු පැමිනීම අපට අවශ්‍යය." යන්නට බොහෝ ඈත ය.

දෙවසරකට පසුවත් බොහෝ නිවැසියන්ට ආපසු පැමිනීමට නොහැකිව සිටින අතර එසේ

පැමිනියවුන් නගරයේ සමාජ සහ භෞතික යටිතල ව්‍යුහය බිඳවැටී තිබීම නිසා යලි පැරනි ජීවිතය යලි ගොඩනගාගැනීමේ දුෂ්කර කාර්යයට මුහුන දී සිටිති. නිව් ඕර්ලියන්ස්හි කුනාටුවට පෙර 455,000ක් වූ ජනගහනයෙන් සියයට 40ක් ආපසු පැමින නැති බවට ගනන් බලා තිබේ. අවතැන් වූවන් පවසන පරිදි දරාගත හැකි මට්ටමේ නිවාස නැතිකම සහ හොඳ රැකියාවන් හිඟ වීම ඊට හේතු වී තිබේ.

කුනාටුවට පෙර පදිංචියට සුදුසු වූ නිවාස ඒකක 5,100න් 1,500ක් පමනක් ඉතිරිව තිබෙන අතර නිවාස ඒකක 3,000ක් බලධාරින් විසින් බිඳ දැමීමට ලැයිස්තු ගත කර තිබේ. ලුවිසියානා සහ මිසිසිපිවල කුනාටුව දැඩි ලෙස බලපෑ ප්‍රදේශවල බදු කුලී දෙගුන හෝ තෙගුන වී තිබේ. කුනාටුවෙන් දිවි ගලවා ගත් 80,000කට වැඩි දෙනා තවමත් එෆ්ඊඑම්ඒය (ෆෙඩරල් හදිසි කලමනාකාර ඒජන්සිය) විසින් සපයන ලද ට්‍රැක්ටර් ට්‍රේලර්වල ජීවත් වෙති.

දැඩි ලෙස හානියට පත් පහල නමවන කොට්ඨාශයේ 19,000ක් වූ පෙර පදිංචිකරුවන්ගෙන් යලි පැමින ඇත්තේ 1000ක් පමන වන අතර බහුතරයක් නිවාස හිස්ව තිබේ. ඒ අසල ශාන්ත බර්නාඩ් කොටසේ කුනාටුවට පෙර සිටි 66,000ක් පදිංචිකරුවන්ගෙන් අඩකටත් අඩු ප්‍රමානයක් යලි පැමින තිබේ.

ජෙන්ට්ලි වැනි ප්‍රාන්තයන්හි හිස් වූ නිවාස එක පෙලට තිබේ. මෙම තුනී ජනගහනයක් සහිත ප්‍රදේශවල සිය ජීවිත ගැටගසා ගැනීමට අරගල කරන පදිංචිකරුවන්ට කඩ-සාප්පුවලට, ලමයින් පාසල් යැවීමට හෝ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට සෑහෙන දුරක් ගමන් කිරීමට සිදු වී තිබේ. කඩවීදි සහ සංචාරක ප්‍රදේශවලට බැහැරින් පොදු ගමනාගමන සේවා අඩාල වී ඇති බැවින් මෝටර් රථ අහිමි අයට මෙය ඉතා විශාල කරදරයකි. 2005 නොවැම්බරයේ දී ලුවිසියානා ව්‍යවස්ථාදායක සභාව, ගංවතුරෙන් පසුව "ශාස්ත්‍රීය වසයෙන් පිලිගත නොහැකි" පාසල් පැවතීම උපුටා දක්වමින් ඕර්ලියන්ස් හි පාසල් 128න් 107ක පාලනය ප්‍රාන්ත රජයට පවරා ගැනීමට සහ යලි ගොඩනැගෙන පාසල් දිස්ත්‍රික්ක සංවර්ධනයට (ආර්එස්ඩී) ඇතුලත් කිරීමට බලය දුන්නේ ය.

බුෂ් පරිපාලනය සහ ප්‍රාන්ත බලධාරීන් නගරයේ පාසල් පවරා ගෙන පෞද්ගලික පාසල්, එනම් ලාභ උපයන හෝ නොඋපයන කන්ඩායම් විසින් පවත්වා ගෙන යනු ලබන රාජ්‍ය අරමුදල් ලැබෙන පාසල් පිහිටුවීමට කැත්‍රිනා බෙදවාචකය යොදාගත්හ. නගරයේ පාසල්වලින් සියයට හැත්තෑවක් දැන් පෞද්ගලික පාසල් බවට පත්ව තිබේ.

නගරයට ආපසු පැමිනෙන පවුල්වලට බොහෝ විට දකින්නට ලැබෙනුයේ තමන්ගේ දරුවන් අසල පාසලට යැවිය නොහැකි බවය. ඒවා එක්කෝ දැන් නැත. නැතිනම් නගරයේ අනෙක් පෙදෙස්වල සිසුන්ගෙන් පිරී ඉතිරී ගොස් ය. එසේත් නැත්නම් ඒවා තෝරා බේරා ලමුන් ඇතුලත් කරගන්නා පෞද්ගලික පාසල් බවට පත්ව තිබේ. අවසානයේ එම පාසල්වලට ඇතුලත් වන සිසුහු තදබද වූ පන්ති කාමර, පෙල පොත් නැතිකම සහ බොහෝ විට ගුරුවරුන් ඉක්මවා යන ආරක්ෂක භටයන් සිටීම ආදියට මුහුන දෙති.

කම්කරුවන් හා දුප්පත් පදිංචිකරුවෝ සෞඛ්‍ය සේවා හදිසි තත්වයක් ලෙස ම වර්ග කල හැකි තත්වයකට ද මුහුන දෙති. රෝගීන් වචනාර්ථයෙන් ම රෝහල් ඇඳන්, මනෝවිද්‍යාත්මක සෞඛ්‍ය පහසුකම් සහ ක්‍රියාත්මක ප්‍රජා සායන නැතිකමින් මියයාමේ තත්වයක් පිලිබඳව වෛද්‍ය වෘත්තිකයෝ විස්තර කරති. ප්‍රදේශයේ කුනාටුවට පෙර තිබූ රෝහල් 22න් හතක් ම අහිමි වූ අතර රෝහල් ඇඳන් සංඛ්‍යාව අඩකින් කැපී ගියේ ය. කුනාටුවට පෙර තිබූ මහ රෝහල් හතෙන් එකක් පමනක් පූර්ව කුනාටු මට්ටමෙන් ක්‍රියාකාරී වී තිබේ. කුනාටුවට පෙර දිලිඳු සහන රක්ෂනය වී නොමැති රෝගීන් සඳහා වූ ප්‍රධානතම රෝහල ලුවිසියානා ප්‍රාන්ත සරසවියේ රෝහල දැන් වැහැරී ගිය පුන්‍ය රෝහලක් ලෙස ක්‍රියාත්මක වේ.

ඕර්ලියන්ස්හි ජෙෆර්සනයේ, ප්ලැක්‍යුමයිනයේ සහ ශාන්ත බර්නාඩ් ප්‍රදේශවල තක්සේරු කරන ලද 98,000ක් ජනයා දැන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා පොරොත්තුවේ සිටිය යුතු ය. බොහෝවිට ඔවුන් පොරොත්තු කාලය මාස ගනනක් විය හැකි ප්‍රාන්තයේ අනෙකුත් ප්‍රදේශවල පිං බෙහෙත් ශාලාවලට යොමු කරනු ලැබේ. නිව් ඕර්ලින්ස්හි වීදිවල රක්ෂන නොවූවන් වෙනුවෙන් පර්යේෂන, ශික්ෂන, කටයුතු සඳහා යෙදවීමට ගොඩනැගෙමින් තිබෙන නව රෝහල 2012 වනතුරු විවෘත නොකැරේ.

දිවි ගලවාගත් අය කුනාටුවේ බහුවිධ බලපෑම්වලින් - මානසික සහ කායික ගැටලු මූල්‍ය පීඩනය, අපරාධ හා ප්‍රචන්ඩත්වය පිලිබඳ භීතිය ඇතුලු ව - මියයාමට පටන් ගෙන ඇති බව වෛද්‍ය ප්‍රජාව පවසයි. නිව් ඕර්ලියන්ස්හි සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ වෛද්‍ය කෙවින් ස්ටීවන්ස් ඇසෝසියේටඩ් ප්‍රෙස් ආයතනයට මෙසේ ප්‍රකාශ කලේ යː "මින් වසර ගනනකට පසුව පශ්චාත් මනෝභ්‍රාන්ති පීඩනය විස්තර කරන පෝස්ටර්වලට යොදා ලනු ඇත්තේ කැත්‍රිනාවෙන් අනතුරුව නිව් ඕර්ලියන්ස් ය"

ඇමරිකානු වෛද්‍ය සංගමයේ සඟරාවක් වන 'ආපදා වෛද්‍ය ක්‍රම සහ සෞඛ්‍යමය සූදානම' හි 2007 ජූලියේ දී ස්ටීවන්ස්ගේ සම කර්තෘත්වයෙන් පලවූ ලිපියක නිව් ඕර්ලියන්ස් හි මරන අනුපාතිකය 2006 ජනවාරි සිට ජූනි දක්වා, 2002-2004 සාමාන්‍යය හා සැසඳීමේදී, සියයට 47කින් ඉහල යාමක් වාර්තා කරයි. ලුවිසියානා බලධාරීහු මරන අනුපාතයේ සුලු ඉහල

යාමක් පෙන්වන ප්‍රාදේශීය මරන දැන්වීම් එකතුවක් රැස් කරමින් මෙම ඉහල යන සංඛ්‍යා ලේඛන නිශ්ප්‍රභ කිරීමට ප්‍රයත්න දැරූහ. අධ්‍යයනයේ කතුවරු ප්‍රාන්ත රාජ්‍ය ගනන්බැලීම්වලට ප්‍රදේශයෙන් පිටමංවීමෙන් අනතුරුව ආපසු ඒමට නොහැකිව අන් ප්‍රදේශවල දී මිය ගිය අයව ඇතුලත් කර නැති බව පෙන්වමින් මෙයට පිලිතුරු දුන්හ.

*ඇසෝසියේටඩ් ප්‍රෙස්* ආයතනය එවන් එක් බෙදවාචකයක් වාර්තා කලේ යඃ ගංවතුරේ ගිලී ගිය නිවසින් බේරී දිවි ගලවා ගැනීමෙන් පසුව අවසානයේ ඔක්ලහෝමාවට ගොස් මාස 10කින් පසුව 59 වන වියේ දී රුධිරය හිරවීමේ හෘද රෝගයට බිලි වී මිය ගිය සිල්වෙස්ටර් මේජර් සිද්ධිය එවැන්නකි. මේජර්ගේ පවුලේ උදවිය පවසන්නේ ඔහු මිය ගියේ කුනාටුවේ බලපෑම සහ ඉවත්කිරීමෙන් පසු මියගිය ඔහුගේ වයසක මව අහිමිවීමෙන් බවය.

මේජර්ගේ සොහොයුරා වන එලිස් කෝල්මන් (කනිෂ්ඨ) මෙසේ ප්‍රකාශ කලේ යඃ "අප ආදරය කල බොහෝ දේවලින් අපට හුරු පුරුදු අයගෙන් ඈත්ව සිටීම... වැනි දේ ඔහුට බලපෑවේ ය. ඔහුට ජීවත්වීමේ ආශාව නැති විය. ඔහුට ප්‍රානසම බව නැතිවිය."

ප්‍රාදේශීය මානසික වෛද්‍ය වෘත්තිකයෝ පදිංචිකරුවන් අතර මානසික ගැටලු ඉහල යාමක් දකිති. ඔශ්නර් රෝහලේ සමාජ ක්‍රියාකාරිනියක වන ලීසා හෙන්ඩ්‍රික්ස් *ඇසෝසියේටඩ් ප්‍රෙස්* වෙත පැවසුවේ, " මානසික සෞඛ්‍ය ගැටලු ඇති පුද්ගලයින් කැත්‍රිනාවට පෙර මෙන් තුන් ගුනයක් වී ඇත. අවනතීන්, දිවි නසා ගැනීම්, (ආවේග), බලාපොරොත්තු සුන්වීම, මත්ද්‍රව්‍ය හා මත් පැන් අපයෝජන යන මේවා සමග එක පෙලට විශාල කායික ගැටලු ද තිබේ."

ලුවිසියානා සහ මිසිසිපිවල "තාවකාලික" වාහන ට්‍රේලර්වල වෙසෙන්නන් අතර මානසික සෞඛ්‍ය ගැටලු මීටත් වඩා තියුනු ය. ජාත්‍යන්තර වෛද්‍ය බලකායේ අධ්‍යයනයට අනුව කුනාටුවෙන් දිවි ගලවා ගත් අය අතර ඇමරිකාවේ අන් ජනයාට වඩා සිය දිවි නසා ගැනීමේ තත්වය 15 ගුනයකින් ඉහල වන අතර අවනතියට ගොදුරු වීමේ අවස්ථාව 7 ගුනයකින් ඉහල ය. ට්‍රේලර්වල වාසය කරන කාන්තාවන් ජාතික අනුපාතිකය මෙන් තුන් ගුනයක ගෘහස්ත ප්‍රචන්ඩත්වයක් අත් විඳින අතර ලිංගික අතවරයනට ලක් වීම් වාර්තා වීම 54 ගුනයක් තරම් ය.

පූර්ව කැත්‍රිනා මට්ටමට යලි ගොඩ නැගී ඇති නිව් ඕර්ලියන්ස් ජීවිතයේ සුලු අංග ගනන අතරින් එකක් වනුයේ 2005 මට්ටමට ආසන්නව මිනිසුන් සිටින, ඊට සරිලන ප්‍රතිපාදන සහිත නගරයේ පොලිස් දෙපාර්තමේන්තුව ය. ප්‍රාන්ත රජයට ඩොලර් මිලියන 35ක බරපැනක් ඇතිව ප්‍රාදේශීය පොලිස් බලකාය අමතරව මිලිටරි නිල ඇඳුමෙන් සැරසී මුර සංචාරයේ යෙදෙන ලුවිසියානා ප්‍රාන්ත හටයින් 60ක් සහ ජාතික ආරක්ෂක හටයින් 300ක් යොදවා ශක්තිමත් කර තිබේ.

නිව් ඕර්ලියන්ස් හි 255,000ක සාමාන්‍ය ජනගහන පදනමේ 100,000ට 63.5ක අනුපාතයක් වන මිනීමැරුම් 161ක් සිදු වී, 2006 දී මනුෂ්‍ය ඝාතන අතුරින් ඇමරිකාවේ පෙරමුනට පැමිනුනේ ය. මේ දක්වා මිනීමැරුම් 150ක් සිදු වී නිව් යෝර්ක් නුවර මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව මෙන් 15 ගුනයක අනුපාතයක් දරමින් යලිත් වරක් ජාතියේ අංක එක වීමට සැරසී සිටී.

එසේ ම නගරයේ සිරකරුවන්ගේ අනුපාතය ජාතික මට්ටම මෙන් දෙගුනයක් වී තිබෙන අතර ඕනෑම ප්‍රධාන ඇමරිකානු නගරයක් සමග බැලීමේ දී ඉහල ම සිරගත කිරීමේ  අනුපාතයට හිමිකම් කියයි. සතියකට සාමාන්‍යය 1,300 ඉක්මවමින් පොලීසිය වාර්තාගත අත්අඩංගුවට ගැනීම් සිදු කරයි. බොහෝ අත්අඩංගුවට ගැනීම් ප්‍රචන්ඩ අපරාධ නොවන ප්‍රධාන වසයෙන් සුලු ප්‍රමාන මත් ද්‍රව්‍ය ලඟ තබාගැනීම් සහ මත්පැන් පානය කිරීම්වලට සම්බන්ධිත ය. මේවා අවුලුවා තිබෙන්නේ දුප්පත් බව හා විරැකියාව හේතුවෙන් ය.

අත් අඩංගුවට ගන්නා වැඩි දෙනා තරුන අප්‍රිකානු ඇමරිකානුවන් වන අතර ඔවුන්ගෙන් අති මහත් බහුතරය කැත්‍රිනා ව්‍යසනයේ දී ආන්ඩු බලධාරීන් ප්‍රදර්ශනය කලා වූ සාමාන්‍ය ජනතාව කෙරෙහි වන හා අවඥා සහගත ආකල්පය මූර්තිමත් කරන තැනක් වන ඕර්ලියන්ස් බන්ධනාගාරයේ (ඕපීපී) රඳවා තිබේ.

කුනාටුව පැමිනෙන විට බන්ධනාගාරයේ 8000ක් රැඳවියන් සිටි අතර ගෙල දක්වා ජලයෙන් යටවන විට බන්ධනාගාර නිලධාරීහු ඉන් සිය ගනනක් අතහැර දැමූහ. බන්ධනාගාරය වටා ගංවතුරේ රැඳවියන්ගේ සිරුරු පාවෙනු දුටු බවට සිරකරුවන් වාර්තා කල අතර අද දක්වාත් බොහා් දෙනෙකුට වූ දෙයක් දන්නේ නැත.

© www.wsws.org